# ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම

සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් වගකීම තක්සේරු කර තහවුරු කර තිබුණු අතර ප්‍රතිපාදනය ආදායමට එරෙහිව අයකර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවලට විශාල ඍණ බලපෑමක් ඇති වී තිබුණි. ඒ අනුව ඉදිරි වර්ෂයන් සඳහා ප්‍රතිපාදනය වැඩිවනු ඇති අතර ඉදිරි පාඩු වැඩිවීමද සිදුවනු ඇත. තවද විශ්‍රාම වැටුප් වගකීම තහවුරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් තත්ත්වයෙහි ඍණ අගයක් දැක්වේ. මෙය විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අයහපත් ලෙස බලපානු ඇත.

#### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පළමුවරට අනුගමනය කිරීම මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 1 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාරව ණය සහ ලැබිය යුතුදෑ , විකිණීමට ඇති දෑ මූල්‍ය වත්කම්වල ලාභය හෝ පාඩුව මගින් සාධාරණ අගයට ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07 ප්‍රකාරව මූල්‍ය උපකරණවලට අදාළව හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව නියම කරන ලද ප්‍රතිලාභී සැලැස්මක් යටතේ වගකීම බෙදාහැරීමේ අරමුණින් නියම කරන ලද ප්‍රතිලාභී සැලැස්ම සඳහා ආයු ගණක තක්සේරුව හා එහි ගිණුම් තැබීම සිදුකර නොතිබුණි. එසේම සේවාදායක විසින් කරන ලද දායකයද ආයෝජනය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව විශ්‍රාම වැටුප් බැරකම සඳහා ආයුගණක තක්සේරුව 2007 වර්ෂයේදී කර තිබුණු අතර ඉන්පසු 2013 මැයි 20 දක්වා විශ්‍රාම වැටුප් බැරකම සඳහා ආයුගණක තක්සේරුවක් කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1991 මාර්තු 19 දිනැති අංක 01 දරන චක්‍රලේඛයට අනුව, මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපති හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යොජනා ක්‍රමයේ පරිපාලන වියදම් ප්‍රතිපූරණය කිරීමට එකඟ වී තිබුණු අතර ඒ අනුව මෙම වියදම් 2010 වර්ෂය දක්වා ප්‍රතිපූරණය කර තිබුණි. කෙසේ වුවද, 2011 වර්ෂය සඳහා ලැබිය යුතු මුදලද මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුදල ගිණුම්වලට ගෙන නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ අදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවන ලද රු.371,190 ක් වූ කොමිස් මුදල විශ්‍රාම වැටුප් බැරකමෙන් අඩුකර තිබුණි. විශ්‍රාම වැටුප් බැරකම තක්සේරු කිරීමේදී මෙම කොමිස් මුදල ඇතුළත් කර නොතිබුණි. එබැවින් එම මුදලින් විශ්‍රාම වැටුප් බැරකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, යෝජනා ක්‍රමයේ සේවකයන් 6 දෙනෙකු සඳහා වැටුප් වියදම් හා පාර්තෝෂික ප්‍රතිපාදන කර තිබුණු බව නිරීක්ෂණය විය. භෞතික පරීක්ෂණයට අනුව, සේවකයන් 4 ක් පමණක් ධීවර විශ්‍රාම වැටුප් අංශයට අනුයුක්ත කර තිබූ බවත් මෙම සේවකයන් සඳහා පමණක් වැටුප් හා පාර්තෝෂික වෙන්කළ යුතු බවත් නිරීක්ෂණය විය. එබැවින් වැටුප් වියදම් රු.602,864 ක් හා පාර්තෝෂික ප්‍රතිපාදන රු.304,360 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණ.

### 1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

ධීවර අංශයෙන් ලැබී තිබුණු තොරතුරු අනුව, පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් 2013 මැයි 20 දක්වා සැසඳීම් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තර | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල | ධීවර අංශය විසින් පවත්වා තිබුණු වාර්තා අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ධීවර විශ්‍රාම වැටුප් සඳහා දායකය | 3,442,392 | 2,934,986 | 507,406 |
| ශුද්ධ දායකය ආපසු ගෙවීම | 506,856 | 191,600 | 315,256 |
| ශුද්ධ පොලී ආපසු ගෙවීම | 433,133 | 204,168 | 228,965 |
| මරණ පාර්තෝෂික ගෙවීම | 658,797 | 826,000 | (167,203) |

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ණය මුදලක් ලෙස රු.මිලියන 608 ක මුදලක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවා තිබූ අතර ශේෂ පත්‍ර දිනයට පොලිය ඇතුළත් හිඟ මුදල රු.මිලියන 608 ක් විය. මෙම හිඟ මුදල අයකර ගැනීමට 2013 මැයි 20 දක්වා ධීවර විශ්‍රාම වැටුප් අරමුදලට නොහැකිවී තිබුණි.

(ආ) එකතුව රු.1,059,025 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු දීර්ඝ කාලයක් නිරවුල් නොකර තිබුණි.

(ඇ) රු.823,980 ක් වූ නොගෙවූ ධීවර විශ්‍රාම වැටුප් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

### 1.2.6 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති , රීති ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | |
| (i) 20 වගන්තිය | විධිවිධාන ප්‍රකාරව උපදේශක කමිටුව නිල බලයෙන් සාමාජිකයන් 06 දෙනෙකු හා නම් කළ සාමාජිකයන් 06 දෙනෙකු ඇතුළත්ව සාමාජිකයන් 12 දෙනෙකුගෙන් |

| | | |
|---|---|---|
| | | සමන්විත විය යුතු වුවද , 2012 වර්ෂය තුළදී සාමාජිකයන් 06 දෙනෙකු පමණක් පත්කර තිබුණි. |
| (ii) | 26 වගන්තිය | පනත ප්‍රකාරව සාමාජික ගාස්තු ගෙවීම පැහැර හැරිය සාමාජිකයන්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| 9 පරිච්ඡේදයේ 7 ඡේදය | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිලධාරීන් කිහිපදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.352,428 ක් වූ විශේෂ දීමනා ගෙවා තිබුණි. |

### 1.2.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලබාදෙන ලද අරමුදල් සඳහා රු.55,301,495 ක පොලී මුදලක් සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද මෙම යෝජනා ක්‍රම දෙක අතර ස්ථිර පොලී අනුපාතයක් ගෙවීමට කිසිදු ගිවිසුමක් නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 92.5 ක් පොලී ආදායමින් නියෝජනය වී තිබූ බැවින් ඉහත මුදල යෝජනා ක්‍රමයේ පොලී ආදායම ලෙස හඳුනා ගැනීම ගැටලු සහගත වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.30,667,022 ක මෙහෙයුම් අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,705,562 ක් වුයෙන් රු.14,961,460 කින් එනම් සියයට 95 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමක් දැක්වුණි. විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | විචලනය |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | % |
| පොලී ආදායම | 59,813,431 | 40,525,747 | 47.6 |
| ධීවරයින්ගේ දායකය | 3,442,392 | 3,025,262 | 13.78 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | (29,496,923) | (24,636,392) | (19.72) |
| වෙනත් මෙහෙයුම් වියදම | (3,091,878) | (3,209,055) | 3.6 |
| මෙහෙයුම් අතිරික්තය | 30,667,022 | 15,705,562 | 95.0 |
| මෙහෙයුම් ප්‍රදාන | - | 1,500,000 | - |
| විශ්‍රාම වැටප් බැරකම වැඩිවීම | (181,213,000) | (170,403,000) | (6.0) |
| පරිපාලන හා මුල්‍ය වියදම් | (4,147,199) | (4,180,860) | 0.8 |
| වර්ෂය සඳහා සමස්ත ඌනතාවය | (154,693,177) | (157,378,298) | 1.7 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා දී තිබූ ණය මත ලැබිය යුතු පොලී වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පොලී ආදායම සියයට 47.59 කින් වැඩිවී තිබුණි. භාණ්ඩාගාර බිල්පත් පොලිය රු.4,511,936 ක් වූ අතර එය මුළු පොලී ආදායමෙන් සියයට 7.5 ක් විය.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ධීවරයන්ගේ දායකය සියයට 13.78 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් අරමුදලට මුළු දායකය රු.3,442,392 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා මුළු විශ්‍රාම වැටුප් ගෙවීම රු.29,496,923 ක් විය. එබැවින් විශ්‍රාම වැටුප් ගෙවීම සියයට757 කින් දායකය ඉක්මවා තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ කරන ලද ආයු ගණක තක්සේරුව මත පදනම්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයට විශ්‍රාම වැටුප් වගකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 ප්‍රකාරව සහතික කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශනවල විශ්‍රාම වැටුප් වගකීම වැඩිවීම රු.181,213,000 ක ලෙස දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ශේෂය රු.මිලියන 27.4 කින් එනම් සියයට 44 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යෝජනා ක්‍රමයට දායකයින් වැඩි ප්‍රමාණයක් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු ප්‍රවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා දායකයින් 2,140 ක් ඉලක්ක කර තිබුණද , බඳවා ගත් තථ්‍ය දායක සංඛ්‍යාව 498 පමණක් වූ අතර සියයට 23.27 ක ඉටුකර ගැනීමක් පමණක් එයින් දැක්වුණි. දිස්ත්‍රික්ක තුනක එක් දායකයෙක් හෝ බඳවා ගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා බඳවා ගැනීම් පිළිබඳ මූල්‍ය ඉලක්කය රු.4,117,000 ක් වූ නමුත්, තථ්‍ය දායකත්වය රු.2,104,381 ක් පමණක් විය. මෙම අඩු කාර්ය සාධනය සඳහා හේතුවී තිබුණේ දිස්ත්‍රික්ක දෙකක එක් දායකයෙක් හෝ මේ සඳහා බඳවා නොගැනීමත් දිස්ත්‍රික්ක 5 ක සඳහා එක් දායකයකු පමණක් බඳවා ගැනීමත් බවද නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දායකයන් 39,854 ක ගෙන් දෙවැනි සහ පසු වාරික එකතු කිරීමේ ඉලක්කය රු.5,978,000 ක් වුවද තථ්‍ය එකතු කිරීම දායකයින් 1,122 ක ගෙන් රු.830,605 ක් පමණක් විය. ඒ අනුව, තථ්‍ය මූල්‍ය ඉටුකරගැනීම සියයට 13.89 ක් පමණක් වූ අතර තථ්‍ය බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට 2.81 ක් පමණක් විය. දිස්ත්‍රික්ක 11 කින් එක් වාරිකයක් හෝ රැස්කර ගෙන නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව, රු.29,496,923 ක් වූ විශ්‍රාම වැටුප් ගෙවීම් කර තිබුණු අතර එකතු කරන ලද මුළු දායකය රු.1,793,052 ක් එනම් සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් වලින් සියයට 6.0 ක් පමණක් විය.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ධීවර විශ්‍රාම යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය අහිමි කරන ලද දායකයින් හඳුනා ගැනීමට හා හිඟ වාරික අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අරමුණු ඉටුකර ගැනීම.

(ආ) ධීවරයින්ට ප්‍රතිලාභ ගෙවීම

(ඇ) ලැබිය යුතු මුදල්

(ඈ) 2 වන සහ පසු වාරික අයකර ගැනීම

(ඉ) උපදේශක කමිටුවල ක්‍රියාකාරීත්වය